බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார அமைச்சு.

**Ministry of Education, Cultural and arts, Sports and Youth affairs**
**Western Province**

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

[illegible]

2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


SSA/09
share this with all faculties
16/07/26

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My Ref. | WPC/EDU/CUL/3/6 - 2026 | |
| ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. | | |
| දිනය / திகதி / Date | 2026.07.08 | |

Student & Staff Affairs
RECEIVED
16 JUL 2026
1243
University of Colombo

15 JUL 2026
17

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය,
කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

**බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව, තරගාවලිය හා සම්මාන උලෙළ - 2026**

ආධුනික කෙටි නාට්‍යකරුවන්ගේ කුසලතා සංවර්ධනයට අවස්ථාවක් සලසා දීම තුළින් කෙටි නාට්‍ය කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීමේ අරමුණ ඇතිව අධ්‍යාපන, සංස්කෘතික හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් උක්ත ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

02. මෙහිදී තෝරා ගනු ලබන අයදුම්කරුවන් සඳහා කෙටි නාට්‍ය පිටපත් රචනය, අධ්‍යක්ෂණය, රංගනය ප්‍රධානව ආනුෂාංගික අංග පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා දින 05ක නේවාසික වැඩමුළුවක්, ස්වතන්ත්‍ර කෙටි නාට්‍ය නිර්මාණ තරගාවලියක් සහ ජයග්‍රාහී කෙටි නාට්‍ය සඳහා සම්මාන උලෙළක් ද පැවැත්වීමට නියමිතය.

03. මේ සඳහා වයස අවුරුදු 18ත් 35ත් අතර බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි තරුණ ප්‍රජාව හට ඉදිරිපත් විය හැකි අතර වැඩසටහනට අදාළ උපදෙස් පත්‍රිකාව සහ අයදුම්පත, මෙම අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk යන වෙබ් අඩවියෙහි කලා හා සංස්කෘතික අංශය වෙතින් බාගත කර ගැනීමට හෝ පහත සඳහන් QR කේතය මඟින් ලබා ගත හැකිය.

04. අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනය 2026.08.10 වන අතර මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් යොමුකිරීම සම්බන්ධයෙන් විද්‍යාර්ථයින් සහ අදාළ පාර්ශව දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

උපදෙස් හා තොරතුරු පත්‍රිකාව

අයදුම්පත

SAR/SSA

Pandikorala
මේනකා පාඩිකෝරල
සහකාර ලේකම්
ලේකම් වෙනුවට
අධ්‍යාපන, සංස්කෘතික හා ක්‍රීඩා අමාත්‍යාංශය (බ.ප)

WC
15/07/2026


දුරකතන අංකය 0112092875
ෆැක්ස් අංකය 0112092874
විද්‍යුත් ලිපිනය mincuituralwp@gmail.com


*(* මෙම ලිපිය විද්‍යුත් තාක්ෂණය ඔස්සේ යොමුකරනු ලබන හෙයින් ( whatsapp / email ) මුල්පිටපත සේ සලකා කටයුතු කරන්න.**



| | කාර්යාලය / அலுவலகம் / Office | ලේකම් / செயலாளர் / Secretary | ක්‍රීඩා / விளையாட்டு / Sports | සංස්කෘතික / கலாசாரம் / Cultural | වට්ස්ඇප් / வாட்ஸ்அப் / WhatsApp | ෆැක්ස් / பெக்ஸ் / Fax |
|---|---|---|---|---|---|---|
| දුරකතන/ தொலைபேசி /Phone | 0112092883<br>0112092875 | 0112092873<br>0112093073 | 0112092887<br>0112093097 | 0112092875<br>0112093105 | 0712092850 | 0112092874<br>0112092894 |
| ඊ මේල් / மின்னஞ்சல் E-mail / | moe.wp.gov@gmail.com | | වෙබ් ලිපිනය/ இணையதளம்/WebSite | | www.moe.wp.gov.lk | |




Scanned with CamScanner

# බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව, තරගාවලිය හා සම්මාන උළෙල - 2026

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය (බ.ප.)

## උපදෙස් හා තොරතුරු පත්‍රිකාව

---

1. බස්නාහිර පළාතේ ආධුනික කෙටි නාට්‍යකරුවන්ගේ කුසලතා සංවර්ධනයට අවස්ථාවක් සලසා දීම තුළින් කෙටි නාට්‍ය කලා ක්ෂේත්‍රය පෝෂණය කිරීම අරමුණු කරගනිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් උක්ත වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

2. වැඩසටහනට සහභාගී වන්නන් විසින් මෙම වැඩසටහනට අදාළ විශේෂිත හා පොදු කොන්දේසි වලට එකඟ විය යුතුය.

3. මෙම වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් දැනුවත් කෙරෙන අතර ඒ සඳහා ඉල්ලුම් කළ හැක්කේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි 2026.08.10 දිනට වයස අවුරුදු 18ත් 35ත් අතර තරුණ ප්‍රජාවට පමණි.

4. වැඩසටහනට අයදුම් කිරීමේ අවම අධ්‍යාපන සුදුසුකම, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීම ලෙස සලකනු ලැබේ.

5. මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමේ දී මෙම උපදෙස් පත්‍රිකාව සමඟ අමුණා ඇති අයදුම්පත් ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතක්,

   ලේකම්,<br>
   බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා ක්‍රීඩා අමාත්‍යාංශය,<br>
   දෙවන මහල,<br>
   නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
   අංක 204,<br>
   ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
   බත්තරමුල්ල.

   යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **"බස්නාහිර පළාත් කෙටිනාට්‍ය වැඩමුළුව, තරගාවලිය සහ සම්මාන උළෙල - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමුකිරීමේ අවසාන දිනය 2026.08.10 වේ. අපැහැදිලි හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. වැඩසටහන පිළිබඳ උපදෙස් පත්‍රිකාව හා අයදුම් පත්‍රය, බස්නාහිර පළාත් පාසල්, කලායතන, විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන, ජාතික තරුණ සේවා සභාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී වෙතින් ද ලබා ගත හැකි අතර බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk යන වෙබ් අඩවියෙහි කලා හා සංස්කෘතික අංශයෙන් ද බා ගත කළ හැකි ය.

7. ලැබී ඇති අයදුම්පත් අතරින් කෙටි නාට්‍ය වැඩමුළුව සඳහා 60 දෙනෙක් තෝරා ගැනීම, බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මඟින් සිදු කෙරේ.

8. කෙටි නාට්‍ය වැඩමුළුව, පිටපත් රචනය, අධ්‍යක්ෂණය, රංගනය ප්‍රධානව ආනුෂාංගික අංග පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා සැප්තැම්බර් මස දෙවන සතිය තුළ දින 05ක නේවාසික වැඩමුළුවක් ලෙස කොළඹ දී පවත්වන අතර සහභාගීවන්නන් සඳහා ආහාරපාන සහ අනෙකුත් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

Scanned with CamScanner

9. වැඩමුළුවෙන් අනතුරුව කෙටි නාට්‍ය තරඟාවලිය සඳහා අත් පිටපත් ඉදිරිපත් කිරීමට සති දෙකක කාලයක් ලබා දේ.

10. ඉදිරිපත් කෙරෙන අත්පිටපත් අතරින් නිෂ්පාදනයට සුදුසු අත්පිටපත් 10ක් තෝරා ගනු ලැබේ. මෙම කෙටි නාට්‍ය මීට පෙර කිසිදු නාට්‍ය තරඟයකට ඉදිරිපත් නොකළ , ප්‍රදර්ශනය නොකළ නාට්‍ය විය යුතු අතර වැඩමුළුව පවත්වන කාලය තුළ ගොඩනඟා ගත් ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණයක් විය යුතුය. රාජ්‍ය විරෝධී, ආගම් විරෝධී, වාර්ගික ගැටුම් ඇතිවන අයුරින් නිර්මාණය වන නාට්‍ය පිටපත් සහ ළමා නාට්‍ය පිටපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර සහෘත්වය ආරක්ෂා වීම, විශේෂයෙන් සළකා බලනු ලැබේ.

11. නාට්‍ය පිටපත් අතරින් ගුණාත්මක කෙටි නාට්‍ය 05ක් තෝරා ගැනීම සඳහා මූලික වටයේ තරඟ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන සුදුසු රංග ශාලාවක දී පැවැත්වේ.

12. තෝරාගන්නා කෙටි නාට්‍ය 05, අවසන් වටයේ තරඟ සඳහා ඉදිරිපත්කළ යුතු අතර මූලික හා අවසන් වටයේ තරඟ සඳහා මූලික පහසුකම් සහිත රංග ශාලා හා ආලෝකකරණ පහසුකම් අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

13. කෙටි නාට්‍ය වැඩමුළුවේ සිට කෙටි නාට්‍ය අවසන් වටය දක්වා සියලු සම්පත්දායක හා ඇගයීම් කටයුතු, කෙටි නාට්‍ය කලාව හා එහි අනුෂාංගික අංග පිළිබඳ ප්‍රවීන ඇගයුම් මණ්ඩලයක් විසින් සිදුකරනු ලැබේ.

14. අවසාන වටයෙන් තේරී පත්වන ජයග්‍රාහී කෙටි නාට්‍ය නිර්මාණ සඳහා ත්‍යාග, සහතික හා සම්මාන ලබා දෙනු ඇත.

15. ප්‍රමිතීන් සාධනය නොකිරීම, අදාළ කොන්දේසි උල්ලංඝනය කිරීම යන කරුණු මත මෙම ප්‍රදාන ලබා නොදීමේ තීරණය බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා ක්‍රීඩා අමාත්‍යාංශය සතු වේ.

16. අවසන් වටයෙන් තෝරා ගැනෙන නාට්‍ය ත්‍රිත්වයෙහි අයිතිය පිළිබඳව ඉදිරි වසර 03ක කාලයක් සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට ගිවිසුමකට එළඹිය යුතු ය. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන ස්ථාන වල වසරක කාලයක් ඇතුළත ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතු ය.

17. මෙම වැඩමුළුව, තරඟාවලිය සහ සම්මාන උළෙල පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් හා විස්තර අවශ්‍ය වන්නේ නම් පමණක් පහත නම් සඳහන් සංස්කෘතික නිලධාරීන් වෙතින් ලබාගත හැකි වේ.

ඩී.ඒ.ඉෂාන්ත දීපාල් මයා - 0701364574
එන්.පී.ලියනගේ මයා - 0724271350

ජී.එල්.වර්ණන් පෙරේරා
ලේකම්,
අධ්‍යාපන, සංස්කෘතික හා ක්‍රීඩා අමාත්‍යාංශය
බස්නාහිර පළාත

Scanned with CamScanner

**බස්නාහිර පළාත් කෙටි නාට්‍ය වැඩමුළුව, තරඟාවලිය සහ සම්මාන උලෙළ - 2026**

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය ( බස්නාහිර පළාත)

**අයදුම්පත**

---

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..................................................................................

..........................................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්): ..........................................................................

..........................................................................................................................................

3. උපන්දිනය : ........................................ 2026.08.10 දිනට වයස: අවු....... මාස....... දින.......

4. ජා.හැ.අංකය : ........................................

5. ස්ත්‍රී /පුරුෂ භාවය: ........................................

6. ස්ථිර ලිපිනය : ..........................................................................................................

..........................................................................................................

7. දුරකථන අංකය : (ස්ථිර)............................................ (ජංගම) ......................................................

(Whatsapp).......................................

8. අධ්‍යාපන සුදුසුකම :

අ.පො.ස.(සා/පෙළ)

| විෂයය | ලබාගත් සාමාර්ථය | වර්ෂය | විෂයය | ලබාගත් සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

9. (i) ඔබ නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස හදාරන්නේ ද? ..........................................................
ක්ෂේත්‍රයෙහි නිරත වන්නේ ද? ..........................................................................................

Scanned with CamScanner

9. (ii) ඉහත 9 (i) හි පිළිතුර ඔව් නම් ඊට අදාළ විස්තර :

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: ..........................................................................................

10. දිස්ත්‍රික්කය: ..................................................................................................................

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලබන කෙටි නාට්‍ය වැඩමුළුව, තරගාවලිය සහ සම්මාන උලෙළට ඉදිරිපත් වීමට අපේක්ෂා කරන මා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් කරුණු සත්‍ය බවත්, කෙටි නාට්‍ය වැඩමුළුවේ දී බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ නීති රෙගුලාසි හා තීරණ වලට එකඟ වන බවත්, මින් ප්‍රකාශ කරමි.

.................................... ....................................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**ග්‍රාම නිලධාරි සහතිකය**

...................................................................................යන අයදුම්කරු විසින් ලබා දී ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවත් සහතික කරමි.

.................................... ....................................................................

දිනය ග්‍රාම නිලධාරිගේ අත්සන හා නිල මුද්‍රාව

**ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

මෙම අයදුම්කරු බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු බව නිර්දේශ කරමි.

.................................... ....................................................................

දිනය ප්‍රාදේශීය ලේකම් (අත්සන හා නිල මුද්‍රාව)

Scanned with CamScanner